# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
# අයදුම්පත් කැඳවීමයි
# උපකුලපති තනතුර

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 34 වැනි වගන්තිය සහ ඉන් පසුව කරණ ලද සංශෝධන සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2023 හි නියමයන් සහ කොන්දේසි අනුව, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල පාලක සභාව විසින් උපකුලපති තනතුර සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්කරුගේ වෘත්තීය හා ශාස්ත්‍රීය පැතිකඩ**

අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු හැට තුනකට (63) අඩු විය යුතුය. උපකුලපතිවරයා කලින් ධූරයෙන් ඉවත් වුවහොත් හෝ විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, වසර තුනක කාලයක් හෝ ඔහු/ඇය ඔහුගේ/ඇයගේ හැටපස් වැනි වසර සම්පූර්ණ වන තුරු, හෝ මේ දෙකෙන් ප්‍රථමයෙන් එළඹෙන දින දක්වා සිය ධූරය දැරිය යුතුය.

විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුව, උපකුලපතිවරයා පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර, විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ගණන්දීමේ නිලධාරියා විය යුතුය. ඔහු/ඇය නිල බලයෙන් පාලක සභාවේ සහ සනාතන සභාවේ සාමාජිකයෙකු සහ සභාපතිවරයා ද විය යුතුය. විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් පාලක සභාව විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති සහ පියවර ක්‍රියාත්මක කිරීම සහ එම ප්‍රතිපත්තිවලට යටත්ව, විශ්වවිද්‍යාලයේ පරිපාලනය සහ විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාම ඇතුළුව එහි මඟ පෙන්වීම, අධීක්ෂණය සහ පාලනය සඳහා උපකුලපතිවරයා වගකිව යුතුය.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම සඳහා ඔහු/ඇය වගකිව යුතු අතර, අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගවීම, ප්‍රජාතන්ත්‍රික කළමනාකරණය සහ ඵලදායී අපක්ෂපාතී නායකත්ව මූලධර්ම ඔහු විසින් පිළිපැදිය යුතුය.

සාර්ථක අපේක්ෂකයා සතුව ශක්තිමත් පර්යේෂණ පැතිකඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග සහ විවිධ අභිරුචි කණ්ඩායම් සමඟ අන්තර් පුද්ගල සබඳතා පිළිබඳ ශක්‍යතාවය, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කැපවීම ඇතුළු ඉහළ අධ්‍යයන ජයග්‍රහණ අපේක්ෂකයා සතුව තිබිය යුතුය. ඔහු/ඇය සතුව විශ්වවිද්‍යාලයක ආචාර ධර්ම සහ මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයක් තිබිය යුතු අතර, ප්‍රජාව කෙරෙහි දක්වන කැපවීම ද ඇතුළත් විය යුතුය.

ඉහත කරුණු සම්බන්ධව වැඩිදුර විස්තර සඳහා *www.vpa.ac.lk* දරණ විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන ලෙස අයදුම්කරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.



SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

**අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය**

අයදුම්කරු ඔහුගේ/ඇයගේ අයදුම්පත සමඟ පහත ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය;

(I) විශ්වවිද්‍යාල සංවර්ධනය සඳහා වූ ඔහුගේ/ ඇයගේ දැක්ම පිළිබඳ ප්‍රකාශය

(II) උපකුලපති තනතුරට තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සාක්ෂාත් කරගැනීමට යෝජනා කරනු ලබන කාර්ය සාධනය පිළිබඳ කෙටි විස්තරයක්

(III) අයදුම්කරුගේ උපන් දිනය ඇතුළු සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක්, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්/ වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි ඡායා පිටපතක්

අයදුම්කරු වත්මන් උපකුලපතිවරයා නම් හෝ මීට පෙර මෙම විශ්වවිද්‍යාලයේම උපකුලපති ධූරය හොබවා ඇත්නම්, ඔහු/ඇය ඉහත සඳහන් කළ (I), (II) සහ (III) ලේඛනවලට අමතරව, ඔහුගේ/ඇයගේ පළමු ධූර කාලය තුළ අත්පත් කරගන්නා ලද ජයග්‍රහණ ඉස්මතු කරන වාර්තාවක් ලබා දිය යුතුය.

අයදුම්කරු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන්නේ නම්, ඔහු/ඇය උපකුලපති තනතුරට පත් කළහොත් ඔහු/ඇය නිදහස් කළ හැකිද යන්න සඳහන් කරමින් සේවායෝජකගෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

සියලුම අයදුම්කරුවන් ඉහත ලේඛන සහ වෙනත් උපකාරක ලියකියවිලි (PDF) ආකෘතියෙන් යුත් මෘදු පිටපතක් සකස්කර ආවරණ ලිපියක් සමඟින් registrar@vpa.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනට හෝ ඊට පෙර එවිය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය**

සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන් අවම වශයෙන් විනාඩි දහයක (10), එහෙත් විනාඩි පහළොවක් (15) නොඉක්මවන කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා විශේෂ පාලක සභා රැස්වීමක් ඉදිරියට කැඳවනු ලැබේ. උපකුලපති තනතුර සඳහා ඔහුගේ/ඇයගේ යෝග්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා, ඔහුගේ/ඇයගේ දැක්ම ප්‍රකාශයේ, කාර්ය සාධන යෝජනාවලියේ, ජීව දත්ත පත්‍රිකාවේ සහ ඉදිරිපත් කිරීමේ සඳහන් කරුණු පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්න කිරීමේ අයිතිය සභාපතිවරයා හෝ පාලක සභාවේ ඕනෑම සාමාජිකයෙකු සතුය.

සුවිශේෂී තත්වයක් තුළ කිසියම් අයදුම්කරුවෙකුට විශේෂ පාලක සභා රැස්වීමට පෞද්ගලිකව පෙනී සිටීමට නොහැකි නම්, ඔහුට/ඇයට ලේඛකාධිකාරී වෙත පූර්ව දැනුම්දීමක් සහිතව වීඩියෝ තාක්ෂණය හරහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.



SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2023 හි සඳහන් පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව අයදුම්කරුවන් ඇගයීමට ලක් කෙරෙනු ඇත.

I. උපායමාර්ගික අවධානය
II. ඵලදායී නායකත්වය
III. සාකල්‍ය චින්තනය / සංකල්පීය කුසලතා
IV. අධ්‍යයන හා පර්යේෂණ විශිෂ්ඨත්වය
V. පුද්ගලික සදාචාරය
VI. වෘත්තීය සන්නිවේදනය
VII. කළමනාකරණ නිපුණතාව

ඇගයීමේ ක්‍රමවේදය http://www.vpa.ac.lk දරණ විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කළ හැක. 2023.04.10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2023 හි දක්වා ඇති පරිදි තෝරා ගැනීම සිදු කෙරේ.

*******

අයදුම්පත් **ලේඛකාධිකාරී / පාලක සභා ලේකම්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, අංක 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් **2026.10.20 වැනි දින ප.ව. 3.00 ට** හෝ ඊට පෙර ලැබෙන පරිදි ලේඛකාධිකාරීවරයා වෙත ගෙනැවිත් භාර දිය යුතුය.

අයදුම්පත සහ අදාළ ලියකියවිලි බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ''උපකුලපති තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

2026.10.20 වැනි දින ප.ව. 3.00 න් පසු ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කිරීම් හෝ ගැටළු සම්බන්ධයෙන්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල පාලක සභාවේ තීරණය අවසාන තීරණය වේ.

**ලේඛකාධිකාරී /පාලක සභාවේ ලේකම්**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල**
**2026.09.20**



Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED